ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2022.08.20

ආර්.පී.ඩී.පී.කසුන් මධුසංඛ
මධුසත්සරණි,
අබහේන, හීලෝගම,
නිකවැරටිය

**පැමිණිලි පාර්ශවය**

1. පොලිස් පරීක්ෂක බී.ඒ.ජී.එස්.එස්. රාජපක්ෂ
ස්ථානාධිපති
පොලිස් ස්ථානය,
රස්නායකපුර.
2. පො.ප. ඩී.එම්.එස්.පී.එස් දිසානායක
පොලිස් ස්ථානය,
රස්නායකපුර.
3. පොලිස් සැරයන් 45687 එච්.පී.කේ. සිල්වා
පොලිස් ස්ථානය,
රස්නායකපුර.
4. පොලිස් කොස්තාපල් රියදුරු 80903
පී.ඩබ්.සේනාරත්න.
පොලිස් ස්ථානය,
රස්නායකපුර

**වගඋත්තරකාර පාර්ශවය**

**පැමිණිලි අංකය :- එච්.ආර්.සී. 4001/17 සහ එච්.ආර්.සී 142/18**

**පැමිණිල්ල :-**

පැමිණිලිකරු 2017.12.26 දින පැමිණිල්ලක් ශ්‍රී ලංකා කොමිෂන් සභාව වෙත යොමු කරමින්, තමා 2017.12.16 වන දින නිවාඩු ලබා නිවසට පැමිණි බවත්, 2017.12.19 වන දින තම නිවස ඉදිකිරීම ආරම්භ කිරීමට එම ස්ථානය වෙත ගිය බවත්, සිවිල් ඇඳුමින් සැරසුනු පුද්ගලයන් දෙදෙනකු පැමිණ පහර දී රස්නායකපුර පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් නිකවැරටිය උසාවිය වෙත ගෝඩා බැරල් හා ගෝඩා පෙරන ස්ථානයේ සිටි බවට කරුණු වාර්තා කර තමා බන්ධනාගාර ගත කළ බවත්, තමා නිවස අසල දී අත්අඩංගුවට ගත් බවට සාක්ෂි සහිත බවත්, රෝහල් ගතව ප්‍රතිකාර ලබාගත් බව ද සඳහන් කරමින් තමාට සිදුවූ මෙම අසාධාරණ පහරදීම පිළිබඳව සොයා බලා අදාළ පුද්ගලයන් නීතිය ඉදිරියට පමුණුවා දඬුවම් දීම හා තමාට සාධාරණයක් ඉටු කර ගැනීම



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

සහනය වශයෙන් අපේක්ෂා කර ඇත. මෙම සිදුවීමට අදාළව වින්දිතගේ බිරිඳ විසින් ද එච්.ආර්.සී 142/18 යටතේ ලිඛිතව 2018.01.24 දින පැමිණිල්ලක් කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

1. 289/2018 හා 2018.02.20 දිනැතිව රස්නායකපුර පොලිස් ස්ථානාධිපති විසින් වාර්තාවක් යොමු කර ඇති අතර, එහි 2017.12.19 වන දින රස්නායකපුර පොලිස් ස්ථානයේ රාජකාරි කරනු ලබන පොලිස් පරීක්ෂක දිසානායක නිලධාරියාට ලද තොරතුරකට අනුව එම නිලධාරියා සහ පොලිස් සැරයන් 45687 සිල්වා, සමඟ පොලිස් කොස්තාපල් රියදුරු 80903 සේනාරත්න නිලධාරියා අංක එල්.එෆ් 0632 පොලිස් කැබ් රථයෙන් පිටව ගොස් අබහේන ප්‍රදේශයේ අප්පු යන අයගේ මිදුලේ කැබ් රථය නතර කර පාගමනින් එම නිවස පිටුපස ඇති අඩි පාර දිගේ කැලෑ ප්‍රදේශයට ගමන් කරමින් සිටියදි පඳුරක් ආසන්නයේ දුමක් යන බවට දැකීමෙන් පසු ඒ සම්බන්ධව විමසිලිමත්ව සිට ඇති බවත්, එහිදී කොණ්ඩය කොටට කපා රැවුල වවන් සිටින තරුණ පුද්ගලයෙක් කලු පැහැති කොට කලිසමක් හා නිල් පාට ටිෂර්ට් එකක් ඇඳගෙන යකඩ බැරලයකට ගින්දර දමමින් සිටිනු දැක ඇති බවත්, එම ස්ථානයට ගමන් කරන අවස්ථාවේ දී සැකකරු එම ස්ථානයෙන් දිව ගොස් ඇති බවත්, නිලධාරීන් එම ස්ථානයට ගොස් පරීක්ෂා කිරීමේ දී නීති විරෝධී මත්පැන් පෙරමින් සිටින බවට අනාවරණය වීමෙන් පසු දිව ගිය සැකකරු පසු පස ලුහුබැඳ යන අවස්ථාවේ එම සැකකරු යතුරු පැදියකින් පලා යාමට උත්සහ දරන අවස්ථාවේ සැකකරුට වරද කියා දී අත් අඩංගුවට ගෙන ප්‍රශ්ණ කිරීමේ දී ඔහු රන්කොත් පේඩි දූරයලාගේ ප්‍රනීත් කසුන් මදුසංක බවට අනාවරණය වී ඇති අතර එම නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සහ බැරල් සහ නීති විරෝධී මත්පැන් පෙරීම සඳහා උපයෝගී කර ගත් උපකරණ දේපල කුවිතාන්සි පත් අංක 606/17 ට ඇතුලත් කර එම නඩු භාණ්ඩ සහ සැකකරු උපසේවා රාජකාරි යෙදි සිටි පො.කො 3030 ඉලංගරත්න නිලධාරියාට බාර දී ඇති බවත්, එම බාර දීමෙන් පසු මෙම සැකකරුගෙන් ප්‍රකාශය සටහන් කරන අවස්ථාවේ දි නාමයන් දෙකකින් පෙනී සිටින බවට කරුණු අනාවරණය වීමෙන් පසු ඔහු බාරයේ තිබු ජාතික හැඳුනුම්පත සහ රියදුරු බලපත්‍රය සහ යුධ හමුදාවෙන් නිකුත් කල තාවකාලික හැඳුනුම්පත් පරීක්ෂා කිරීමේ දී ජාතික හැඳුනුම්පතේ අංකය ලෙස 199109100310 ද එහි නම රත්නායක මුදියන්සේලාගේ ප්‍රනීත් කසුන් මදුසංක ලෙසත් ලිපිනය 394 ඒ කහහේන වග ලෙසත් රියදුරු බලපත්‍රයේ අංකය බී 1799296 ලෙසත් එහි හැඳුනුම්පත් අංකය 910910310V ලෙසත් එහි නම රන්කොත් පේඩි දූරයලාගේ ප්‍රනිත් කසුන් මදුසංක ලෙසත් ලිපිනය 394 ඒ කහහේන වග කොළඹ ලෙසත් තාවකාලික යුධ හමුදා හැඳුනුම්පතේ සෙසු නිලයේ හැඳුනුම්පත ආර්. පී.ඩී.කේ ලෙසත් සඳහන්ව තිබු හෙයින් සැකකරුගෙන් ප්‍රශ්ණ කිරීමේ දි එක් එක් අවස්ථාවල වෙන වෙන නම් වලින් පෙනී සිටින බවට අනාවරණය වීමෙන් පසු ඒ පිළිබඳ හා නීති විරෝධී මත්පැන් පෙරීමට අදාලව විමර්ශණයක් සිදු කිරීමට අවශ්‍ය වූ බැවින් සැකකරු එදින නිකවැරටිය ම උ.බි 1041/17 යටතේ නිකවැරටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කල බවත් අධිකරණය විසින් මෙම සැකකරු විමර්ශන නිමා කර වාර්තා කරන තෙක් 2017.12.22 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කල බවත්, සැකකරු බන්ධනාගාර ගත වීමෙන් පසු 2017.12.22 වන දින ඇප ලබා දී ඇති බවත් සඳහන් කර ඇත.

සැකකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කර ඇති පැමිණිල්ලට අදාල ව කිසිදු චෝදනාවක් පිලි නොගන්නා බවත් සැකකරු නීති විරෝධී මත්පැන් පෙරමින් සිට පලා යන අවස්ථාවේ දි නිලධාරීන් විසින් පැහැදිලිව සැකකරු හඳුනා ගෙන ඔහු පසු පස ලුහුබැඳ සැකකරු අත්අඩංගුවට ගෙන නීති විරෝධී මත්පැන් පෙරීම සිදු කල තැනැත්තා බවට අනාවරණය කර ගෙන ඇති බවත්, සැකකරුට එම නිලධාරීන් විසින් පහර දුන්නේ නම් පොලිස් ස්ථානයේ දි තමා වෙත දැනුම් දීමට ඉඩකඩ තිබූ අතර එවැනි සිද්ධියක් සම්බන්ධව දැනුවත් නොකල අතර සැකකරු නිකවැරටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමේ දි නිලධාරීන් විසින් පහර දීමක් සිදු කලේ නම් ඒ පිළිබඳ ගරු මහේස්ත්‍රාත්තුමියට දැනුම් දීමට ඉඩ තිබූ අතර එවැනි සිද්ධියක් සම්බන්ධයෙන් ගරු අධිකරණයට සැකකරු විසින් දැනුම් දී නොමැති බවත්, මෙම සැකකරු එදින බන්ධනාගාර ගත වූ අතර නිලධාරීන් විසින් ඔහුට පහර දීමක් සිදු කර තිබුනා නම් ඒ පිළිබඳ බන්ධනාගාර ගත වන අවස්ථාවේ බන්ධනාගාර අධිකාරිවරයාට හෝ සැකකරු බාර ගත් නිලධාරීන් හට ප්‍රකාශ කිරීමට ඉඩ කඩ තිබූ අතර එවැනි අසනීප තත්වයක් සම්බන්ධව කිසිදු ප්‍රකාශයක් කර නොමැති බවත්, ගරු අධිකරණය විසින් සැකකරුට ඇප

ලබා දීමෙන් පසු රෝහල් ගත වී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කරමින් සැකකරු විසින් සිදු කල නීති විරෝධි ක්‍රියාවෙන් බේරීම සඳහා මෙවැනි ක්‍රියා මාර්ගයක් ගෙන ඇති බවට තමා අදහස් කරන බවත්, සැකකරු හට පහර දීමක් හෝ කිසිදු මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදු වී නොමැති බව දැනුම් දී ඇත.

2. රස්නායකපුර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති බී.ඒ.ජී.එස්.එස් රාජපක්ෂ විසින් 2018.08.21 දින පරික්ෂණයේ දී ප්‍රකාශයක් ලබා දෙමින්, සිදුවීමට අදාළ දිනයේ දී මහව ප්‍රදේශයේදී තෑගි ප්‍රධාන උත්සවයකට තමා සහභාගිවී සිටි බවත් ස්ථානාධිපති වැඩ බැලීම සිදු කලේ පොප දිසානායක යන නිලධාරියා බවත්, එම නිලධාරියා විමර්ශන කටයුත්තක් සඳහා සහභාගිවී සිටියදී නීති විරෝධි මත්පැන් පෙරීමට බාවිතා කරන ගෝඩා මිලි ලීටර් අසූපන් දහසක් සත්තකයේ තබා ගැනිම හා නිලධාරීන් පැමිණෙන අවස්ථාවේදී දිවයෑම නිසා ඔහු ලුහුබැද ගොස් අත්අඩංගුවට ගෙන ඇති බවත් ඒ සමග ස්ප්‍රිත්තු මිලි ලීටර් 750 යකඩ බැරලයක් රබර් හොස් එකක් සහිත තබ දගරයක් තිබූ බවත්, අත්අඩංගුවට ගැනීමෙන් පසුව මෙම සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරිමෙන් අනතුරුව රිමාන්ඩ් කර ඇති බවත් සඳහන් කර ඇත.

ගෝඩා ළග තබා ගැනීම සම්බන්ධයෙන් තැනැත්තෙකු අත්අඩංගුවට ගනු ලැබුවේ නම් සුරා බදු ආඥා පනතට අනුව ස්ථානීය ඇපයක් පවා නියම කළ හැකි අවස්ථාවකදී මෙම සැකකරු බන්ධනාගාර ගත කිරීමට විමර්ශන නිලධාරි හේතු විමසීමේ දී, මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සැකකරුට පහරදීමක් සිදුකළ බවට ප්‍රදේශයේ කතා බහකට ලක්ව තිබෙන බැවින් අධිකරණයට ඉදිරිපත් කළ බවත් සැකකරු පුද්ගල නම් දෙකකින් පෙනී සිටින බවටද කරුණු අනාවරණය විම මත රිමාන්ඩ් බන්ධනාගාර ගත වූ බවත් සඳහන් කර ඇත. රිමාන්ඩ් බන්ධනාගාර ගත විමට හේතු වූ නම් දෙක සම්බන්ධයෙන් කරුණු විමසීමේ දී එම නම් දෙකම එකම නමක් බව තහවුරු කර ගත් බවත් සඳහන් කර ඇත.

3. 2018.10.25 වන දින පැවති පරික්ෂණයේ දී පොලිස් පරීක්ෂක ඩී. එම්. එස්. පී. එස් දිසානායක, පොසැ 45687 එච්.පී.කේ.නිහාල් සිල්වා සහ පොකොරි 80903 පී.ඩබ්.සේනාරත්ත යන අය සහභාගී වෙමින්, අබහේන ප්‍රදේශය නීති විරෝධී මත්පැන් කසිප්පු සඳහා ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශයක් බවත් එම ප්‍රදේශයේ නිරන්තර වැටලීම් කරමින් මෙම කසිප්පු ජාවාරම සිදු කරන පිරිස් අත්අඩංගුවට ගැනීම සඳහා කටයුතු කළ බවත්, 2017.12.19 වන දින ද පැය 8.25 ට පමණ පුද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලැබුණු තොරතුරක් මත අබහේන ප්‍රදේශයට ගිය බවත්, දුරකථන ඇමතුමෙන් කිහිප දෙනෙකු එක්ව කසිප්පු පෙරන බවක් දැනුම් දී ඇති බවත්, ඒ අනුව අදාළ ස්ථානයට පොප දිසානායක හා පො.කො.රි.80403 සේනාරත්ත පොසැ.45687 සිල්වා නැමැති නිලධාරීන් සමඟ අංක එල් එෆ් 0632 දරණ කැබ් රථයෙන් එම ස්ථානයට ගිය බවත්, යන අවස්ථාවේදී එම ස්ථානයේ සිටි පිරිස් පලා ගිය බවත් එම ස්ථානයේ සිටි මෙම පැමිණිලිකරු ඔහු ඉදිකරමින් පවතින නිවස දෙසට ගොස් යතුරු පැදියකින් අතුරු පාරක් දිගේ පැමිණෙන අවස්ථාවේදී රැක සිට පරික්ෂා කළ බවත් එහිදී අත්අඩංගුවට ගැනීමට හේතු වූ කරුණු පහදා දී අත්අඩංගුවට ගත් බවත්, අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව ස්ථානයට ඉදිරිපත් කළ අතර එදිනම අධිකරණයට ඉදිරිපත් කළ බව ද සඳහන් කර ඇත.

මෙහිදී නීති විරෝධී මත්පැන් සම්බන්ධයෙන් අත්අඩංගුවටගත් අය රක්ෂිත බන්ධනාගාර ගත වූ හේතුව විමසීමේ දී, අධිකරණය රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත් නීති විරෝධී මත්පැන් සම්බන්ධව අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, නම් දෙකක් සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් පැවති බැවින් රක්ෂිත බන්ධනාගාර ගත වූ බවත්, නම් දෙකක් නොමැති බව පසුව අනාවරණය කර ගත් බවත්, ඒ වන විට අදාළ සැකකරු බන්ධනාගාර ගත වී සිටි බව ද අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර නම් පිළිබඳ ගැටළුව නිරාකරණය කර විමර්ශනයකින් පසුව අධිකරණයට ඉදිරිපත් නොකිරීමට හේතු විමසීමේ දී කිසිවක් ප්‍රකාශ කර නොමැත. අත්අඩංගුවට ගැනීමට හේතු වූයේ මොහු එම ස්ථානයේ සිට නිවස දෙසට දිව යනවා දුටු බැවින් බවත් වගඋත්තරකරුවන් පහරදීම පිළිබඳ චෝදනාව ප්‍රතික්ෂේප කරන නමුත් මෙහිදී අවම බලය භාවිතා කළ බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**පරීක්ෂණයේ දී අනාවරණය වූ කරුණු :-**

1. 2018.08.21 දින පැවති පරීක්ෂණයේ දී වින්දිත විසින් ප්‍රකාශයක් ලබා දෙමින්, 2017.12.19 වන දින ඉදි කරමින් පවතින තම නිවසේ අවශ්‍යතාවයක් සඳහා යන අතරතුර අබහේන ප්‍රදේශයේදී සිවිල් ඇඳුමින් සිටි තිදෙනෙකු යතුරු පැදිය නවතා අදාළ ලේඛන විමසූ බවත් ලේඛන ලබාදීමට පෙර එම පාර්ශවයන් කවුරුන්ද යන්න විමසූ බවත්, එහි පිටුපසින් පැමිණි එක් නිලදාරියෙකු රාජකාරි හැඳුනුම්පත පෙන්වා තමා පොලිස් නිලධාරින් බවත් ඔවුන් සමඟ පොලිස් ස්ථානය වෙත යාමට පැමිණෙන ලෙස ප්‍රකාශ කළත් වරදක් සිදුකර නොමැති බැවින් එසේ යාමට නොහැකි බව ප්‍රකාශ කළ ද අදාළ නිලධාරීන් විසින් තම කම්මුල ප්‍රදේශයට වැරෙන් ප්‍රහාරයක් එල්ල කළ බවත් නිලධාරීන්ගේ බලපෑම මත පොලිස් ස්ථානය වෙත ඔවුන් පැමිණ සිටි කැබ් රථයෙන් ගිය බවත් පොලිස් ස්ථානයේ ඔවුන් විසින් සටහන් කර ගනු ලැබූ ප්‍රකාශයකට බලෙන් අත්සන් ගත් බවත්, තමාට සිදුවූ මෙම අසාධාරණය සම්බන්ධයෙන් පවුලේ ඥාතීන්ට සැලකළ යුතු බව ප්‍රකාශ කළද ඒ පිළිබඳව අවධානයක් යොමු නොකොට අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලද බවත්, අධිකරණයට රැගෙන යන අවස්ථාවේදි ඥාතින්ට දැනුම්දීමක් නොකල අතර පොලිස් ජීප් රථයේ සිටි සැකකරු අත තිබූ ජංගම දුරකථනයකින් තම භාර්යාවට දුරකථන ඇමතුමක් ලබා දුන් බවත් ඒ අනුව ඇය නිකවැරටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත පැමිණ සිටි බවත් ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණ:-**

1. 2018.10.23 දිනැතිව සිංහල පේඩි දුරයලාගේ වසන්ත කුමාර ජයතිලක යන අය දිවුරුම් ප්‍රකාශයක් මඟින්, ආර්.පී.ඩී.ප්‍රනීත් කසුන් මධුසංක යන අය මෙම ප්‍රදේශයේ අයෙකු සමග විවාහ වී සිටින ශ්‍රී ලංකා යුධ හමුදාවේ සන්නද්ධ බුද්ධි බලකායේ සේවය කරන අයෙකු බවත්, ප්‍රදේශයේ ඉඩම් කොටසක් මිලට ගෙන එහි නිවසක් සාදවමින් සිටින අතරතුර දී 2017.12.19 දින තම නිවස පසු කර දෙවට පාර දිගේ ඔහු යනවා තමා දුටු බවත්, එදින රස්නායකපුර පොලිසියෙන් ප්‍රදේශයේ නීතිවිරෝධී මත්පැන් වැටලීමක් සිදුකරමින් ඉන්දික පියදාස නැමැත්තා තම නිවසේ සිටිනවාදැයි බැලීම සඳහා රස්නායකපුර පොලිසියේ නිලධාරීන් බව සඳහන් කර දෙදෙනෙකු සිවිල් ඇඳුමින් සැරසී තම නිවසට පැමිණි බවත්, තමාට ඉන්දිකව හමු නොවූ බව කී පසු එම දෙදෙනා ආපසු ගිය අතර මද වේලාවකින් තම නිවස අසල ඇති දෙවට පාරෙන් කලහ සද්දයක් ඇසුන හෙයින් එදෙස බැලීමේදී ආර්.පී.ඩී.ප්‍රනීත් කසුන් මධුසංක සහ සිවිල් ඇඳුමින් සිටි පොලිස් නිලධාරීන් බව සඳහන් කළ දෙදෙනා කෝලාහලයක් ඇති කරගත් බව තමා දුටු බවත්, ප්‍රනීත් කසුන් මධුසංක කොට කලිසමකින් සහ ටීෂර්ට් එකක් ඇඳ සිටි අතර ඔහු පැමිණි යතුරු පැදිය එම ස්ථානයේ නවතා තිබූ බවත් එක් නිලධාරියෙකු *"ආ උඹ ආමිද යමන්කො පොලිසියට ආමි එක පෙන්නනම්"* කියා ඔහු ඉදිරියෙන් යවා එකී නිලධාරීන් ඊට පිටුපසින් ප්‍රනීත් කසුන් මධුසංකගේ යතුරු පැදියෙන් ගමන් කරනවා තමා දුටු බවත්, මෙම සිද්ධිය සම්බන්ධයෙන් නිකවැරටිය සහකාර පොලිස් අධිකාරි කාර්යාලයෙන් තමාගෙන් කටඋත්තරයක් ලබා ගත් බවත් තමා එදින සිදු වූ සත්‍ය සිද්ධිය එහි ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත.

2. 2018.10.23 දිනැතිව තම්මිටලාගේ ඉන්දික පියදාස යන අය දිවුරුම් ප්‍රකාශයක් මඟින්, ආර්.පී.ඩී.ප්‍රනීත් කසුන් මධුසංක තම ඉඩමේ කොටසක් මිලට ගෙන එහි නිවසක් සාදවමින් සිටින අතරදී 2017.12.19 දින රස්නායකපුර පොලිසියෙන් ප්‍රදේශයේ නීතිවිරෝධී මත්පැන් වැටලීමක් සිදුකළ බවත්, තමාද සිය අගහිඟකම් හා නැතිබැරිකම් නිසා මිතුරෙකු වූ සුදා යන අයෙකු සමග ඒ වන විට මත්පැත් කොටසක් පෙරා තිබූ බවත් වැටලීම් කරන අවස්ථාවේදී තමා බේරීම සඳහා මග හැරියද තම ගෝඩා බැරලයක් නිලධාරීන් හට හසු වූ බවත්, එදින රස්නායකපුර පොලිසියෙන් වැටලීමට පැමිණි සිවිල් ඇඳුමින් සිටි තිදෙනෙකුට ප්‍රනීත් කසුන් මධුසංක යන අය ඔහු සාදවමින් සිටි නිවස අසල පිහිටි දෙවට පාරේ යතුරු පැදියකින් යමින් සිටියදී නිලධාරීන්ට මුණ ගැසෙනවා දුටු බවත්, සිවිල් ඇඳුමෙන් සිටි අය ප්‍රගීත් කසුන් මධුසංක යන අයට පහර දෙනවා දුටු බවත්, ඉන්පසු තමා එම ස්ථානයට පැමිණ ප්‍රනීත් කසුන් මධුසංක යන අය මෙම ප්‍රදේශයේ අයෙකු නොවන බවත් ඔහු නිවස සෑදවීම සඳහා පැමිණ සිටි අයෙකු බවත් නිලධාරීන්ට අවබෝධ කරවා දුන් පසු එම නිලධාරීන් ප්‍රනීත් කසුන් මධුසංක යන අයද රැගෙන ඉදිරියට ගිය බවත් එම සිද්ධියට හේතුව විමසීමේදී කසුන් විසින්, සිවිල් ඇඳුමෙන් සිටි පිරිස හේතු රහිතව ඔහුගෙන් හැඳුනුම්පත ඉල්ලා සිටි අවස්ථාවේදී එම හැඳුනුම්පත ළඟ නොමැති බවත් එය ඇත්තේ ගෙදර බව සඳහන් කල පසු එම පිරිස ප්‍රකෝප වී ඔහුට පහර දුන් බවත් සඳහන් කළ බවත්, තමා දන්නා තරමින්

ඔහු කිසිදු නීති විරෝධී කටයුත්තක් කර නොමැති බවත් ඔහු ප්‍රදේශයට පැමිණ සිටියේ තම විවාහක බිරිඳ පදිංචි ප්‍රදේශයේ නිවස සෑදීමට බවත් එදින හසු වූ ගෝඩා සහ මත්පැන් තමාගේ වන අතර එම ද්‍රව්‍ය වෙනුවෙන් රස්නායකපුර පොලිසියෙන් නඩු පවරන ලද්දේ ඉහත කී පහර කෑමට ලක් වූ ප්‍රනීත් කසුන් මධුසංක වෙත බවත් ඉහත කී සිද්ධිය සම්බන්ධව හා එදින පොලිසියට හසු වූ තම භාණ්ඩ සම්බන්ධව ද තමා සත්‍ය විස්තරයක් 2018.01.02 දින නිකවැරටිය සහකාර පොලිස් අධිකාරීවරයාට දැන් වූ බවත් සඳහන් කර ඇත.

3. Dig/ku/nk/tp/20/2018 හා 2018.10.09 වන දිනැතිව 'ජනපතිට කියන්න' ව්‍යාපෘතිය වෙත යොමු කරන ලද අංක PRE/2018/N/003997 දරණ පැමිණිල්ල සම්බන්ධවයෙන් ඩබ්.කේ.ජයලත් නියෝජ්‍ය පොලිස්පති, කුරුණෑගල දිසාව විසින් පැමිණිලිකරුගේ බිරිඳගේ නමට යොමු කරන ලද ලිපියේ පිටපත පරීක්ෂණ අවස්ථාවේ දී සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇත.එහි, පැමිණිල්ල සම්බන්ධයෙන් සිය සෘජු අධීක්ෂණය යටතේ විමර්ශනයක් සිදු කරන ලද බවත්,එම විමර්ශනයට අනුව ආර්. පී. ඩී.පී කසුන් මධුසංඛ යන අය 2017.12.19 වන දින අඹහේන ප්‍රදේශයේදී නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා මිලි ලීටර් 85000 ක්ද, නීති විරෝධී මත්පැන් පෙරීමේ උපකරණ සහ නීති විරෝධී මත්පැන් ස්ප්‍රිත්තු මිලි ලීටර් 750 ක් සන්තකයේ තබාගැනීමේ වරදට සහ නීති විරෝධී මත්පැන් නිශ්පාදනය කිරීමේ වරදට රස්නායකපුර පොලිස් ස්ථානයේ පොලිස් පරීක්ෂක දිසානායක නිලධාරියා ඇතුළු නිලධාරින් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන නිකවැරටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 39555 දරණ නඩුව පවරා ඇති බව රස්නායකපුර පොලිස් ස්ථානයේ පොත්පත් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ බවත්, මෙම සිද්ධියට අදාළ පුද්ගලයා අත්අඩංගුවට ගැනීමේදී පොලිස් නිලධාරින් විසින් පහරදීමක් සිදු කිරීම සහ නිකරුණේ නඩු පැවරීම සම්බන්ධයෙන් කරුණු අනාවරණය කරගෙන එවැනි ක්‍රියාවන් පොලිස් නිලධාරින් විසින් සිදු කර ඇත්නම් ඔවුන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම සඳහා වයඹ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමාගේ නියෝග අනුව සහකාර පොලිස් අධිකාරි ඩී. එම්. සමරකෝන් බණ්ඩා මහතා විසින් මූලික විමර්ශනයක් සිදු කළ බවත්ය.

එම විමර්ශනයේදී අනාවරණය වූ කරුණු අනුව පුද්ගලයා අත්අඩංගුවට ගැනීම සිදු කර ඇති පො.ප. දිසානායක නිලධාරියා විසින් ඔහු අත්අඩංගුවට ගත් අවස්ථාවේදී අවශ්‍ය බලය පාවිච්චි කල බවට සටහන් යොදා ඇතත්, ලැබී ඇති සාක්ෂි මගින් හා වෛද්‍ය වාර්තාවට අනුව ඔහුට පහරදීමක් සිදු කර ඇති බව විමර්ශනයේදී අනාවරණය වී ඇති හෙයින් මෙම නිලධාරියාට එරෙහි ව දෙපාර්තමේන්තු මට්ටමින් විනයානුකූලව දඬුවම් කිරීම සඳහා (1) අපකීර්තිදායක හැසිරීම . (2) අණට අකීකරුව පීඩාකාර ලෙස හැසිරීම යන චෝදනා යටතේ චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. තවද එම පුද්ගලයාට එරෙහිව මෙම නිලධාරියා විසින් පවරා ඇති නඩුවට අදාලව පොත්පත්වල යොදා ඇති සටහන් වලට අනුව එම නඩුව බොරු නඩුවක් බවට විමර්ශනයේදී සාක්ෂි කිසිවක් ඉදිරිපත් වී නොමැති බවත්, එබැවින් ඒ සම්බන්ධයෙන් නඩුව අවසන් වන තෙක් මෙම නිලධාරියාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමේ හැකියාවක් නොමැති බවත්. මෙම නඩුව දැනට අධිකරණයේ විභාග වෙමින් පවතින හෙයින් එම නඩු විභාගයේදී එහි නිදොස් භාවය ඔප්පු කිරීමේ හැකියාවක් පවතින බවට දන්වා ඇති බව නිරීක්ෂණය වේ.

4. පැමිණිලිකරුගේ බිරිඳ විසින් ලිඛිත පැමිණිල්ලක් සිදුකර තම ස්වාමිපුරුෂයා 2017.12.16 වන දින නිවාඩු ලබා නව නිවසේ වැඩ කටයුතු 2017.12.19 වන දින ආරම්භ කිරීම කළ බවත්, අනතුරුව අප සිටි ස්ථානය වෙත ඉතාමත් හදිසි අවශ්‍යතාවයකට මෙන් ලොකු අම්මා පැමිණ " *මධු පුතාට පොලිසියෙන් ගහලා ජීප් එක ලගට අරගෙන ගියා*" යැයි ප්‍රකාශ කළ බවත්, ජීප් රථය නවතා තිබූ ස්ථානය වෙත දුවගෙන ගිය බවත්, සිවිල් ඇඳුමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකු තම ස්වාමියාව ජීප් රථය ළගට රැගෙන එනවා දුටුබවත්, ඔහු අසලට ගොස් පහරදීමක් පිළිබඳව විමසීමේ දී වම් පස කම්මුල පෙන්වූ බවත්, එවිට කම්මුල ඉදිමී ඇස අසල රතු වී තිබෙනු බව තමා දුටු බවත්, පහරදුන් අය විමසීමේ දී ඔහු විසින් සිවිල් ඇඳුමින් සිටි තුන් දෙනා අතරින් සුදු පැහැති ෂර්ට් එකක් ඇද සිටි අය තමාට පෙන්නූ බවත්, ඔහු පො ප දිසානායක බවත්, ඔහුගෙන් හේතු විමසීමේ දී පොලීසියට රැගෙන යා යුතු බව සඳහන් කළ බවත්, පොලිස් ස්ථානයේ දී නිලධාරියා නිල ඇඳුමින් සිටි බවත් සිය පියාට ද බැන වැදුණු බවත්, පො ප දිසානායක පොලිස් ස්ථානයේ දී පුටුවෙන් නැගිට '*මම මුව කසිප්පු නඩුවකට දානවා තමුසෙලාට කරන්න පුළුවන් දෙයක් කරනවා*' ලෙස පැවසූ බවත්, නිකවැරටිය පොලිස්

අධිකාරි කාර්යාලය වෙත මේ සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලි කළ බවත්, 2017.12.22 වන දින සිදුවීමට අදාළව සාක්ෂි ලෙස පුද්ගලයින් 8 දෙනෙකු කරුණු ලබාදුන් බවත් සඳහන් කර ඇත.

5. 142/18 පැමිණිල්ලට අදාළව වින්දිත ලිඛිත ප්‍රකාශයක් මගින්, 2017.12.19 වන දින නව නිවස සාදන ස්ථානය වෙත යතුරු පැදියෙන් අතුරු පාරේ යන අවස්ථාවේදී ඉදිරියෙන් සිවිල් හැඳගත් පුද්ගලයින් දෙදෙනෙකු (ඉදිරියෙන් පැමිණි පුද්ගලයා සුදු පැහැති කළු පැහැය කලවම් වූ ෂර්ට් එකක් හා කළු පාටට හුරු කලිසමක් ඇඳ, පසුපසින් පැමිණි පුද්ගලයා කොළ පැහැති ටී ෂර්ට් එකක් හා දිග කලිසමක්, දණහිසට වන තෙක් නවාගෙන) පැමිණි බවත්, පසුපසින් පැමිණි පුද්ගලයා අත දමා යතුරු පැදිය නවතන ලෙස සංඥා කිරීමෙන් යතුරු පැදිය නැවැත්වූ බවත්, පසුපසින් පැමිණි පුද්ගලයා කොහේද යන්නේ විමසූ බවත්, ගෙදර යන බව පැවසූ බවත්, රියදුරු බලපත්‍රය විමසීමේ දී අදාල අයගේ අනන්‍යතාවය තමා විමසූ බවත් ඔවුන් පොලිස් නිලධාරීන් බව සඳහන් කළ බවත්, වාහන බලපත්‍ර පරීක්ෂා කරමින් සිටිය දී රැකියාව විමසූ පසු තමා යුධ හමුදාවේ සේවය කරන බව පවසනවා සමඟම '*ආමි එකේ පකයලා තමයි මේ ඔක්කොම කරන්නේ*' ලෙස පවසා වම් කම්මුලට පහරක් ගැසූ බවත්, නැවත තම කොළරයෙන් ඇද නැවත පහර දීමට යන අවස්ථාවේ ඉන්දික අයියා ඔහුගේ ලොකු පුතා සහ දෙවැනි පුතා සමඟ පැමිණ '*සර් සර් මෙයා මුකුත් දන්නේ නැහැ මෙයා ආමි එකේ ඉන්නේ නිවාඩු ඇවිත් එහා පැත්තේ ගේ හදනවා මෙයා මෙහෙ කෙනෙක් නෙවෙයි*' යනුවෙන් ප්‍රකාශ කළ බවත්, ඉදිරියෙන් සිටි පුද්ගලයා ඉන්දික අයියාටද '*තො දන්නේ නැත්ද යකෝ මුට කියලා දෙන්න අපි කවුද කියලා*' යනුවෙන් කෑගැසූ බවත්, තමා පසෙකට තල්ලු කර යතුරු පැදියේ යතුර ද උදුරාගෙන '*එහා පැත්තේ ජීප් එක නවත්තලා තියෙනවා එතනට ලයිසන් එක අරන් වරෙන් හා උඹ ආමි එකෙනේ ඉන්නේ උඹගේ ජොබ් එකටත් කෙලවන්නම්*' යනුවෙන් ප්‍රකාශ කළ බවත් තමා පොලිස් ස්ථානයට රැගෙන ආ බවත් පසුව අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, බන්ධනාගාරය වෙත රැගෙන ගිය බවත් බන්ධනාගාර නිලධාරීයෙකු විසින් පොලිස් පහරදීම් සිදු වී තිබේද විමසීමේ දී, තමාට පොලිසිය විසින් පහරදුන් බවත්, වම් කම්මුල පෙදෙස රිදෙන බවත්, වෛද්‍යවරයෙකු ලවා පරීක්ෂා කර ගැනීමට අවැසි බවත් දැනුම් දුන් පසු, බන්ධනාගාර පොලිස් පහරදීම් පොතෙහි සටහන් කර ගත් බවත් සඳහන් කර ඇත. තව ද 2017.12.22 වන දින නැවත නිකවැරටිය උසාවියේ වැඩබලන මහේස්ත්‍රාත්තුමා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රුපියල් 50,000ක ශරීර ඇපයක් මත නිදහස් කිරීමෙන් පසු, නිකවැරටිය මූලික රෝහල් අධිකරණ වෛද්‍ය නිලධාරී මහතා වෙතද ඉදිරිපත් වූ බවත් සඳහන් කර ඇත.

6. අධිකරණ වෛද්‍ය පෝරම අංක 763/17 යටතේ නිකවැරටිය මූලික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි එම්.යූ. රත්නායක මහතා විසින් 2017.12.23 වන දින පැමිණිල්ලේ නම් සඳහන් වින්දිත පරීක්ෂා කර ඇති අතර, එහි රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය ලෙස, "*2017 දෙසැම්බර් 19 දින උදේ 9.30 පමණ අඹහේනදී මගේ අලුතින් හදන ගෙදරට වැඩට බාල්දියක් ගේන්න බයික් එකේ යද්දී මනුස්සයෝ දෙන්නෙක් ඇවිල්ල බයික් එක නතර කරලා කොහෙද යන්නේ කියලා ඇහුවා. අහලා මගෙන් ලයිසන් ඉන්ෂුවරන්ස් ඉල්ලුවා.මම ඇහුවා ඔයගොල්ලෝ කවුද කියලා. එතකොට කිව්වා පොලීසියෙන් කියලා. මම ඒ ගොල්ලන්ගෙන් අයිඩී එක ඉල්ලලා බැලුවා. මගෙන් ඇහුවා කොහෙද වැඩ කරන්නේ කියලා. මම කිව්වා ආමි එකේ කියලා.මට කුණුහරුපෙන් බැනලා එක්කෙනෙක් අත මිට මොලවලා වම් පැත්තේ මූණට ගැහුවා. ඊට පස්සේ ටී ෂර්ට් එකෙන් ඇදලා ගත්තා.ඉන්දික කියන අයියත් එතනට අවා.බයික් එකේ යතුර ගත්තා.මට පාරට එන්න කියලා ජීප් එකේ දාගෙන පොලීසියට එක්කගෙන ආවා. මාව රිමාන්ඩ් කළා. පැය 1 ½ විතර ඇතුලට දාලා නිකවැරටිය උසාවියට එක්කගෙන ආවා. මාව උසාවියෙන් රිමාන්ඩ් එකට දැම්මා*' ලෙස සඳහන් කර ඇත. අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාල ලෙස වම් හකු ප්‍රදේශයේ මද වශයෙන් වූ මෘදු වීමක් ඇති බවත් එය බරපතල නොවන තුවාල ලෙස ද මොට ආයුධයක් මගින් තුවාල සිදුවී ඇති බවත් වෛද්‍යවරයා සඳහන් කර ඇත.

7. පො.ප දිසානායක විසින් 2017.12.19 දින 8.35ට පිටුව 250 ඡේදය 156හි ස්ථානාධිපතිගේ අවසර හා නියෝග මත පුද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලද තොරතුරක් මත පරීක්ෂා කිරීමට අංක 02 නිල ඇඳුමින් සැරසී පො.ප 45687 සිල්වා, පො.කො.රි 80903 සේනාරත්න විසින් පදවන ලද එල්.එෆ් 0632කැබ් රථයෙන් පිටත්ව

ගිය බවට සටහන් යොදා ඇති නමුත් මෙම වැටලීම සඳහා සිවිල් ඇඳුමින් සහභාගී වී ඇති බව වින්දිතගේ ප්‍රකාශ හා දිවුරුම් ප්‍රකාශ මගින් ලබා දී ඇති සාක්ෂි මඟින් තහවුරු වන අතර ඒ හේතුවෙන් වින්දිතට වගඋත්තරකරුවන් පොලිස් නිලධාරීන් බවට තහවුරු කර ගැනීමට සිදුව ඇති බව නිරීක්ෂණය වේ.

8. වින්දිත විසින් පොලිස් ස්ථානයේ ලබා දී ඇති ප්‍රකාශය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලිඛිත ඉදිරිපත් කරන ලද කරුණු, පරීක්ෂණ අවස්ථාවේ දී සිදුකර ඇති ප්‍රකාශ හා අධිකරණ වෛද්‍යවරයා වෙත ලබා දී ඇති ප්‍රකාශ එකිනෙක සමාන වන බව නිරීක්ෂණය වේ.

9. වින්දිත විසින් ලබා දී ඇති ප්‍රකාශය අනුව පො ප දිසානායක විසින් සිය වම් කම්මුලට අත මිට මොලවා පහර දුන් බව සඳහන් කර ඇති අතර, අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව වම් හකු ප්‍රදේශයේ මෘදුවීමක් සහිත බවත් මොට ආයුධයකින් සිදුකරන ලද බරපතල නොවන තුවාලයක් බවත් සඳහන් කර ඇති බැවින් ඔහුගේ ප්‍රකාශය සහ තුවාල රටාව එකිනෙක ගැලපෙන බව නිරීක්ෂණ වේ.

10. නියෝජ්‍ය පොලිස්පති, කුරුණෑගල විසින් පැමිණිලිකරුගේ බිරිඳ වෙත යොමු කර ඇති ලිපිය මඟින්, විමර්ශනයේදී වින්දිත අත්අඩංගුවට ගැනීම සිදු කර ඇති පො.ප. දිසානායක නිලධාරියා විසින් ඔහු අත්අඩංගුවට ගත් අවස්ථාවේදී අවශ්‍ය බලය පාවිච්චි කල බවට සටහන් යොදා ඇතත්, ලැබී ඇති සාක්ෂි මගින් හ වාර්තාවට අනුව ඔහුට පහරදීමක් සිදු කර ඇති බව විමර්ශනයේදී අනාවරණය වී ඇති බවත් එම නිලධාරියාට එරෙහි ව දෙපාර්තමේන්තු මට්ටමින් විනයානුකූලව දඬුවම් කිරීම සඳහා (1) අපකීර්තිදායක හැසිරීම . (2) අණට අකීකරුව පීඩාකාර ලෙස හැසිරීම යන චෝදනා යටතේ චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. 2018.10.25 දින මානව හිමිකම් කොමිෂන් සභවේ පැවති පරීක්ෂණයේ දී ද උක්ත වගඋත්තරකරුවන් විසින් අවම බලය භාවිතා කළ බව සඳහන් කර ඇති අතර පොලිස් සටහන් තුළ ද අවශ්‍ය බලය පාවිච්චි කරමින් වින්දිත භාරයට ගත් බව සඳහන් කර ඇත.

11. පො ප දිසානායක විසින් 2017.12.19 දින පිටුව 250 ඡේදය 157හි පැමිණීමේ සටහනෙහි, පුද්ගලික ඔත්තුකරුවෙක් ගෙන් ලබා දුන් තොරතුර පරිදි අබහේන හීලෝගම දි රන්කොත් පේඩි දූරයලාගේ ප්‍රනීත් කසුන් මදුසංක යන අය නිති විරෝධි මත්පැන් පෙරමින් සිටිය දී පැය 09.40 ට අත් අඩංගුවට ගත් බවත්, සැකකරු බාරයේ තිබු ගෝඩා මිලි. ලීටර් 85000 ක් අඩංගු යකඩ බැරලය තබ දගරය හා අනෙකුත් දේ භාරයට ගෙන උපසේවකට භාරදුන් බව සඳහන් කර ඇත.

12. 2017.12.20 දින 10.50ට පිටුව 282 හි ඡේදය 174හි පො.ප දිසානායකගේ සටහන් අලවා ඇති අතර එහි, 'මාගේ පුද්ගලික ඔත්තු කරුවෙකු විසින් මාගේ ජංගම දුරකථනයට පැය 08.25 ට පමණ ලැබුණු තොරතුරක් වන අබහේන කපිල යන අයගේ ලී මෝල ඉදිරි පිට කැලේ ප්‍රදේශයේ ඉන්දික හා තවත් පුද්ගලයින් කීප දෙනෙකු නීති විරෝධි මත්පැන් පෙරන බවට. ඒ අනුව මා නිලධාරින් සමඟ කැබ් රථයෙන් ප්‍රධාන මාර්ගයේ උණගොල්ලට පැමින බංගලා කන්ද ප්‍රදේශයට යන මාර්ගයේ පැමිණ කපිලගේ ලී මෝල ආසන්නයේ පිහිටි අප්පු යන අයගේ මිදුලේ රථය නතර කර පා ගමනින් නිවස පිටු පස ඇති අඩි පාර ඔස්සේ කැලෑ ප්‍රදේශයට ඇතුල් වුනා. ටික දුරක් යන විට අප දුටුවා පඳුරක් ආසන්නයෙන් කුඩා දුමක් යන බවට අප හෙමින් හෙමින් එම ස්ථානයට පඳුරු වලට මුවා වී ලං වුනා. මෙම ස්ථානයට ආසන්නව වතුර ඇලක් ගලා බසින බැවින් එම ස්ථානය ජලයෙන් පිරී තිබුනා. තව දුරටත් ලගා වී බලන විට අප දුටුවා කොන්ඩය කොටට කපා රැවුල වවා සිටින තරුණ පුද්ගලයෙක් කලු පැහැති කොට කලිසමක් හා නිල් පාටට හුරු ටීෂර්ට් එකක් හැද ගෙන යකඩ බැරලයකට යටින් ගින්දර දමනවා. මෙම බැරලයට රබර් හෝස් එකක් සම්බන්ධ කර එය නිල් පැහැති ප්ලාස්ටික් බූලියකට දමා තිබුනා. මේ අවස්ථාවේ අප ඔහු ආසන්නයට ලගා වන විට වතුර සද්දයට මොහු එක වර අප දෙස බලා පැන දිව්වා. ඒ අවස්ථාවේ පොසැ සිල්වා සමග මොහු පස පස දිව ගිය අතර ජලය පිරී තිබුන බැවින් ඒ ආසන්නයේ තිබූ වෙනත් ඉඩමක් හරහා දිව ගොස් සැකකරු දිව ගිය නිවසට යන මාර්ගයට ආවා. එවිට මෙම පුද්ගලයා රතු පැහැති ස්කූටි මෝටර් පැදියක නැඟී පැන යාමට උත්සහා කලා. අප මාර්ගය හරස් කොට මොහුව නවතා අල්ලා ගැනීමට උත්සහා කිරීමේ දී අපත් සමග පොර බදා පැන යාමට උත්සහ කලා. අප ඔහුව අවශ්‍ය බලය යොදා අප බාරයට ගත්තා. මේ අවස්ථාවේ මා ඔහුගෙන් ප්‍රශ්ණ කර පදිංචි කොහෙද කියා ඇසුවා. එවිට ඔහු ගෙයක් හදන බවට අතින් දික් කර ඉන්දික යන අයගේ නිවසට ආසන්නයේ අලුතින් ඉදි කරනු ලබන නිවසක් පෙන්වා සිටියා.

පසුව තමා මොහු නීති විරෝධී මත්පැන් පෙරමින් සිටි ස්ථානයට රැගෙන විත් පො.කො.රි. 80903 සේනාරත්නට බාර දී මා පො.සැ 45687 සිල්වා සමඟ එම ස්ථානයේ තිබූ ප්ලාස්ටික් කෑනය පරීක්ෂා කරන විට එහි නීති විරෝධී මත්පැන් ස්ප්‍රීතු බවට හඳුනා ගත්තා. එයට දමා තිබූ දඟරය සහිත හෝසය තමා ඉවත් කර යකඩ බැරලය පරීක්ෂා කර බලන විට එහි ගෝඩා ඇති බවට හඳුනා ගත්තා. ඒ අනුව පැය 09.40 ට අබහේන හීලෝගම දී රන්කොත් පේඩි දූරයලාගේ ප්‍රනීත් කසුන් මදුසංක යන අය බලපත්‍ර නොමැතිව නීති විරෝධී මත්පැන් පෙරීමේ වරදට අත් අඩංගුවට ගත්තා ලෙස සටහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

13. 2017.12.20 පිටුව 284 ජේදය 175හි පො.සැ. සිල්වාගේ වැටලීම් සටහනෙහි 2017.12.19 වන දින පැය 10.50 ට අබහේනේදී පො.සැ 45687 සිල්වා පො.ප දිසානායක මහතා සමග පො. කොරි 80903 සේනාරත්න විසින් පදවන ලද අංක ඩබ්ලිව් පි එල් එප් 0632 දරන කැබ් රථයෙන් අංක 02 නිල ඇඳුමින් සැරසී පො.ප දිසානායක මහතාට ලැබූ තොරතුර අනුව කපිලගේ ලීමෝල ඉදිරිපිට කැලෑ ප්‍රදේශයේ ඉන්දික හා තවත් කීප දෙනෙකු කසිප්පු පෙරන බවට මා පො.ප දිසානායක මහතා සමග කැබ් රථයෙන් උණගොල්ල මාර්ගයේ බංගලා කන්ද දෙසට මාර්ගයේ පැමිණ කපිලගේ ලී මෝල ඉදිරි පිට අප්පු යන අයගේ නිවස ඉදිරි පිට මිදුලේ කැබ් රථය නවතා කැලෑ ප්‍රදේශයේ පා ගමනින් අඩි පාරේ කැළෑ ප්‍රදේශයට ඇතුලු වුනා. අප කැලෑවේ ඉදිරි පිටින් යන විට අප දුටුවා ඉදිරියෙන් කැලෑ රොදක් ආසන්නයේ කුඩා දුමක් යනවා. අප එම ප්‍රදේශයට පඳුරු වලට මුවා වෙලා එම දුම දක්වා ලං වුනා. එම ස්ථානයේ වතුර ඇලක් ගලාගෙන යනවා. එම අවට ජලයෙන් පිරී තිබුනා. තවත් ලංවී බලන විට අප දුටුවා කොන්ඩය කොටට කපා ගත් රැවුල වවා සිටින තරුණ පුද්ගලයකු කලුපාට කොට කලිසමක් නිල් පාට හුරු ටීසර්ට්ස් එකක් ඇද ගෙන යකඩ බැරලය යටට ගින්දර දානවා මෙම බැරලය රබර් හෝස් එකක් සවිකර තිබුනා. නිල් පාට ප්ලාස්ටික් බුලියක් දමා තිබුනා. අපි එම ස්ථානයට තවත් ලං වෙන කොට අපේ කකුල් වලට වතුර පෑගෙන ශබ්දය ඇසි ඔහු අප දෙසට හැරී බලා පැන දිව්වා. මා දිසානායක මහතා සමග ඔහු පසු පස දුව ගිය අතර ඔහු දිව ගිය මාර්ගය වතුර පිරී තිබුනා. ඒ අසල තිබූ ඉඩම හරහා දිව ගොස් ඒ නිවසට යන අඩි පාරට ආවා. අපි එම ස්ථානයේ සිට දිවගිය පුද්ගලයා රතුපාට ස්කූටි බයිසිකලයක නැගී පැන යාමට උත්සහ කලා. දිසානායක මහතා මාර්ගය හරස් කර මොහු ව නවතා ගත්තා. අපි ඔහුව අල්ලා ගැනීමට උස්සහ කල විට ඔහු අපි සමග පොර බැදුවා. පොර බදා පැන යාමට උත්සහ කලා. අවශ්‍ය බලය පාවිච්චි කරමින් ඔහුව අප බාරයට ගත්තා. දිසානායක මහතා ඔහුගෙන් ප්‍රශ්ණ කලා. ඔහු අතින් පෙන්නුවා ගෙයක් හදන බව, එම නිවස ඉන්දික යන අයගේ නිවස ආසන්නයේ ඇති බවත් කිව්වා. අප දුටුවා අලුතින් නිවසක් හදමින් ඇති බවට මා දිසානායක මහතා සමග එම පුද්ගලයා කසිප්පු පෙරමින් සිටි ස්ථානයට රැගෙන ගියා. පො.කො.රි සේනාරත්නට සැකකරු බාර දී මා දිසානායක මහතා සමග එම ස්ථානයේ තිබූ නිල් පාට කෑනය පරික්ෂා කිරිමේ දි නී.වි.ම මත් ස්ප්‍රීතු බවට අප හඳුනා ගත් බව සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

14. 2017.12.20 දින වගඋත්තර 02 සහ 03 විසින් යොදා ඇති උක්ත සටහන් අනුව වගඋත්තරකරුවන් නිශ්චිතවම ඉන්දික යන අය සහ තවත් පිරිසක් අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය බවට දැනුවත්ව සිටි බව තහවුරු වේ. වින්දිත අත්අඩංගුවට ගැනීම සිදුකරන අවස්ථාවේ ඉන්දික යන අය පොලිස් නිලධාරීන් හමුවට පැමිණ වින්දිත පිටස්තර ප්‍රදේශයක පදිංචිකරුවකු බවට කරුණු ඉදිරිපත් කර ඇති බව ඉන්දික යන අය විසින් ඉදිරිපත් කරන දිවුරුම් ප්‍රකාශ මඟින් දැනුම් දී ඇත. සිදුවීම වන අවස්ථාවේ පිරිසක් සිටි නමුත් වින්දිත යුද්ධ හමුදාවේ සේවය කරන බැවින් බැනවැදී පහර දී ඇති බවත්, අදාළ ස්ථානයේ වින්දිත සිටි බවට නිශ්චිතව තහවුරු කර ගැනීමකින් තොරව යතුරු පැදියේ අතුරු මාර්ගයේ ගමන් ගත් පුද්ගලයා පලා යන බවට නිගමනය කර අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ. තව ද රත්නායකපුර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති බී.ජී.ජී.එස්.එස් රාජපක්ෂ මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සැකකරුට පහරදීමක් සිදුකළ බවට ප්‍රදේශයේ කතා බහකට ලක්ව තිබෙන බැවින් අධිකරණයට ඉදිරිපත් කළ බව ද මා.හි.කො. සභාවේ පරීක්ෂණයේ දී සඳහන් කර ඇති නමුත් වින්දිත අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ.

15. නිකවැරටිය ම/උ බී1041/17 වෙත 2017.12.19 දිනැතිව කරුණු ඉදිරිපත් කරමින්, නිසි බලපත්‍රයක් නොමැතිව නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය කිරීම හා ගෝඩා ළඟ තබා ගැනීම සහ මත්පැන් ස්ප්‍රීතු ළඟ තබා ගැනීම හා පෙරීමේ උපකරණ ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් පලමු වගඋත්තරකරු විසින් අධිකරණය වෙත

කරුණු වාර්තා කර ඇති අතර, පො ප දිසානායක නිලධාරියාට ලද තොරතුරකට අනුව අබහේන හිලෝගම කපිල යන අයගේ ලී මෝල ඉදිරිපිට කැලෑ ප්‍රදේශයේ නීති විරෝධි මත්පැන් පෙරන බවට ලද තොරතුරට අනුව එම ප්‍රදේශයට ගොස් සැඟවී වීම සිලා බලා සිටිය දී යමෙකු ඇල අසල බැරලයක් ලිප තබා ගිනි දමමින් සිටිනවා දැක ඇති බවත්, ඒ අනුව නිලධාරීන් එක වරම එම ස්ථානයට ගොස් පරීක්ෂා කර ඇති බවත්, පරීක්ෂා කිරීමේ දි නීති විරෝධි මත්පැන් පෙරන බවට අනාවරණය වීමෙන් පසු එම ක්‍රියාවේ යෙදි සිටි තැනැත්තාගෙන් නීති විරෝධී මත්පැන් පෙරීම සඳහා බලපත්‍ර ඇත්තේ ද යන්න ප්‍රශ්ණ කිරීමේ දී කිසිදු බලපත්‍රයක් ඉදිරිපත් කිරීමට අපොහසත් වී ඇති බවත්, සැකකරුගෙන් ප්‍රශ්ණ කිරීමේ දී සැකකරු රන්කොත් පේඩි දූරයාලාගේ ප්‍රනීත් කසුන් මදුසංක බවට අනාවරණය කර ගැනීමෙන් පසු නීති විරෝධි මත්පැන් නිෂ්පාදනය කිරීම, ගෝඩා ලග තබා ගැනීම, පෙරීමේ උපකරණ ලග තබා ගැනීම සහ ස්ප්‍රීතු ලග තබා ගැනීම සම්බන්ධයෙන් වරද කියා දී පැය 09.40 ට අබහේන හීලෝගම දී අත් අඩංගුවට ගෙන නඩු භාණ්ඩ ලෙස දේපල කුවිතාන්සි අංක 606/17 ගෝඩා මිලි ලීටර් 85000 ක් අඩංගු යකඩ බැරලයෙන් ලබා ගන්නා ලද ගෝඩා සාම්පල් ඇතුලත් කළ බවත්, ඔහුගේ හැදුනම්පත් පරිශීලනය කිරීමේ දී එකිනෙකට පරස්පරතා ඇති බවට පෙනී යන බැවින් සැකකරු සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන බවත් දක්වා ඇත.

තව ද සැකකරු විසින් සිදු කරනු ලබන මෙවැනි ක්‍රියා හේතුවෙන් ප්‍රදේශයේ සාමය පවත්වා ගෙන යාමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති අතර මෙම ප්‍රදේශයේ අපරාධ වර්ධනයක් දක්නට ඇති බවත්, මෙම සිද්ධියට අදාලව තවත් සැකකරුවන් සම්බන්ධ වී ඇත්තේද යන්න සහ මහා පරිමානයේ මෙම නීති විරෝධි ක්‍රියාව සිදු කරන්නේ ද යන්න සහ මෙම නීති විරෝධි මත්පැන් නිෂ්පාදනය කර බෙදා හරින්නේ කාටද යන්න සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යන අතර විමර්ශන මෙතෙක් නිමා කර නොමැති බවත්, නම් කීපයකින් මෙම සැකකරු පෙනී සිටින අතර වෙනත් අපරාධ වලට සම්බන්ධ අයෙක්ද යන්න වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යන අතර විමර්ශන මෙතෙක් නිමා කර නොමැති බැවින් 2017.12.22 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙසට ඉල්ලීම් කර ඇති බව නිරීක්ෂණය වේ.

16. නීති විරෝධී මත්පැන් පෙරීම සඳහා බලපත්‍ර ඇත්තේ ද යන්න ප්‍රශ්ණ කිරීමේ දී කිසිදු බලපත්‍රයක් ඉදිරිපත් කිරීමට අපොහසත්ව ඇති බව අධිකරණය වෙත වාර්තාකර ඇති අතර, නීති විරෝදී මත්පැන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමක් සිදුනොකරන තත්වයක ඒ සම්බන්ධයෙන් අවබෝධයක් නොමැතිව හෝ වින්දිත වෙත හිතාමතා වරද පැවරීමේ චේතනාව මත අධිකරණයට කරුණු ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

17. තවද වින්දිත නම් දෙකකින් පෙනී සිටි බවට කරුණු වාර්තා කර ප්‍රදේශයේ සාමය පවත්වා ගෙන යාමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති බවත් ප්‍රදේශයේ අපරාධ වර්ධනයක් දක්නට ඇති බවත් සඳහන් කර 1997 අංක 30 දරණ ඇප පණත අනුව ඇප ලබාදීම රීතියක්ව පැවතියද චේතනාන්විතව ඇප ලබා නොදී බන්ධනාගාරගත කිරීමේ ව්‍යතිරේතකය ක්‍රියාත්මක කිරීමේ චේතනාව මත කරුණු ඉදිරිපත් කර ඇති බවත් පසුව එම නම් දෙකම එක නමක් බව තහවුරු කරගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

18. ගෝඩා ළග තබා ගැනීම සම්බන්ධයෙන් වින්දිත අත්අඩංගුවට ගනු ලැබුවේ නම් සුරා බදු ආඥා පනතට අනුව ස්ථානීය ඇපයක් නියම කළ හැකි අවස්ථාවකදී ස්ථානාධිපතිවරයා විසින්, සුරාබදු ආඥාපනතේ 46 යටතේ, '*ආඥාපනත හෝ ඒ යටතේ පනවා ඇති රීති හෝ නියෝග හෝ ආඥාපනත යටතේ ලබාගෙන ඇති යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් කඩ කරමින් සිදුකරනු ලැබූ වරදවල්*' සඳහා වින්දිත අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර වින්දිත අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් නොමැති බව සඳහන් කර ඇති නමුත් බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් ලබා ගෙන ඇති පුද්ගලයකු විසින් කඩ කරන ලද වැරදි සඳහා වින්දත චෝදනාවට ලක්කර ඇති බව නිරීක්ෂණය වේ.

19. නිකවැරටිය ම/උ වෙත ඉදිරිපත් කර ඇති බී වාර්තාවේ සහ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යතුරු ලේඛනය කර ඉදිරිපත් කර ඇති උදෘතයන්හි ද ගෝඩා මිලිලීටර් 85000ක් තිබූ බව සඳහන් කර ඇති නමුත්, රස්නායකපුර පොලිස් ස්ථානයේ තොරතුරු සටහන් පොතේ 2017.12.19 වෙලාව 11.20 පිටුව 250 හා ඡේදය

152හි පොප දිසානායක විසින් අත්අකුරින් පැමිණීමේ සටහනෙහි මැනීමේ උපකරණයෙන් මැනීමේ දී ගෝඩා මිලි ලීටර් 8500ක් වූ බවට සටහන් යොදා ඇති අතර එහි පිටපතක් පැමිණිලිකරු විසින් සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. තව ද රස්නායකපුර පොලිස් ස්ථානය විසින් සියලුම උද්‍යත යතුරු ලියනය කර ඉදිරිපත් කර ඇති නමුත් මුල් පිටපත්හි ජායාපිටපත් ලබා දී නොමැති බව ද නිරීක්ෂණය වේ.

20. අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති වාර්තාවේ ක්‍රියාවේ යෙදී සිටි තැනැත්තාගෙන් නීති විරෝධී මත්පැන් පෙරීම සඳහා බලපත්‍ර ඇත්තේ ද යන්න ප්‍රශ්ණ කිරීමේ දී කිසිදු බල පත්‍රයක් ඉදිරිපත් කිරීමට අපොහසත් වී ඇති බවත්, සැකකරු විසින් සිදු කරනු ලබන මෙවැනි ක්‍රියා හේතුවෙන් ප්‍රදේශයේ සාමය පවත්වා ගෙන යාමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති අතර මෙම ප්‍රදේශයේ අපරාධ වර්ධනයක් දක්නට ඇති බවටත් කරුණු වාර්තා කර ඇති නමුත් වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ හා යොදා ඇති සටහන්හි ඇතුළත් කරුණු පරස්පර වේ. වින්දිත විසින් පැමිණිල්ලේ සඳහන් කර ඇති කරුණු වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ මඟින් ද තහවුරු වන අතර වින්දිත නිවසට යන මාර්ගයේ දී අත්අඩංගුවට ගෙන අදාළ ස්ථානය වෙත වගඋත්තරකරුවන් විසින් රැගෙන ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

21. පැමිණිලිකරු, ඔහුගේ බිරිඳ, පවුලේ සාමාජිකයන් සහ ප්‍රදේශවාසීන් විසින් ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශවලින් සහ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව අත්අඩංගුවට ගැනීමේ අවස්ථාවේදී ඔහුට පොලිස් නිලධාරීන් විසින් පහර දී ඇති බවත්, කුරුණෑගල නියෝජ්‍ය පොලිස්පති විසින් සිදු කළ විමර්ශනයේ දීද අදාළ පොලිස් නිලධාරියා වන පො ප දිසානායක මහතා අවශ්‍යතාවය මත අවශ්‍ය බලයක් භාවිත කර පහරදීමක් සිදුකර ඇති බවට කරුණු අනාවරණය කරගෙන තිබීම, සහ පරීක්ෂණයේ දී ලබා දී ඇති ප්‍රකාශ ඇතුළු සාක්ෂි මත පදනම්ව වින්දිතට වගඋත්තර 02 වන පො.ප. ඩී.එස්.එස්.පී දිසානායක විසින් පහරදීමක් සිදු කර ඇති බවත් තහවුරු වේ.

22. වින්දිත අත්අඩංගුවට ගැනීමේ දී හෝ අත්අඩංගුවට ගැනීමෙන් පසු නිශ්චිතව හේතුව වින්දිතට හෝ ඥාතීන්ට දැනුවත් කර නොමැති අතර වගඋත්තර 02 විසින් ඥාතීන්ට තර්ජනාත්මක ලෙස වින්දිතට කසිප්පු නඩුවක් දානවා කරන්න පුළුවන් දෙයක් කරනවා ලෙස ප්‍රකාශ කර ඇති බව සාක්ෂි අනුව නිරීක්ෂණය වේ. අධිකරණයට කරුණු වාර්තා කිරීමේ දී සැකකරු විසින් සිදු කරනු ක්‍රියා හේතුවෙන් ප්‍රදේශයේ සාමය පවත්වා ගෙන යාමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති බවත් මෙම ප්‍රදේශයේ අපරාධ වර්ධනයක් දක්නට ඇති බව සඳහන් කර රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස වගඋත්තර 01 විසින් ඉල්ලීම් කර ඇති බව නිරීක්ෂණය වේ.

23. රස්නායකපුර ස්ථානාධිපති ලෙස කටයුතු කරන ලද වගඋත්තර 01 විසින් පැමිණිලි පාර්ශවය සමග සිදුකරන ලද සාකච්ඡාවකට අදාළ හඬ පටයක් සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇති අතර, එහි දී වගඋත්තර 01 විසින් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් සමතයකය පත්වන ලෙස සඳහන් කරමින් මෙම පැමිණිල්ල ඉල්ලා අස්කරගැනීමට කටයුතු කරන ලෙස වින්දිතගේ බිරිදට දැනුම් දෙන අතර එය සිදුකළ හොත් පැමිණිලිකරු නිදොස් කොට නියෝජ්‍ය පොලිස්පති වෙත කසිප්පු වලට අදාළ බඩු තමාගේ බවට පිලිගන්නා ලද ඉන්දික යන අයට අදාළව නීති කටයුතු සිදුකරන බව සඳහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

24. ඒ අනුව වගඋත්තර 02,03,04 විසින් වින්දිත නිවසට යන මාර්ගයේ දී අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇති අතර වගඋත්තර 02 විසින් වින්දිතගේ වම් කම්මුල වෙත මිට මොලවා පහර දී ඇති බවත්, වගඋත්තර 01 විසින් සිදුවීම වන අවස්ථාවේ දී රාජකාරී සිදුකර නොමැති බව සඳහන් කර ඇති නමුත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

පැමිණිල්ල සම්බන්ධයෙන් සිදුකර ඇති පරීක්ෂණ හා ඉදිරිපත් කර ඇති සාක්ෂි හා වාර්තා අනුව, සාක්ෂි ලෙස දිවුරුම් ප්‍රකාශ ද අධිකරණ වෛද්‍ය වාර්තාව, කුරුණෑගල නියෝජ්‍ය පොලිස්පති විසින් සිදු කළ නිල විමර්ශනය අනුව, පැමිණිලිකරු වන ආර්.පී.ඩී.පී. ප්‍රනීත් කසුන් මධුසංඛ මහතා අත්අඩංගුවට ගැනීමේදී වගඋත්තර පො ප ඩී.එම්.එස්.පී.එස්. දිසානායක විසින් පහරදීමක් සිදු කර ඇති බව සනාථ වේ. එමඟින් ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ

තුන්වන පරිච්ඡේදයේ , 11 වගන්තිය වන කිසිම තැනැත්තෙකු වධ හිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකල යුතුය, සහ 13(5) වරදකරු යයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තෙකුම නිර්දොෂී යයි පූර්වානුමාන කල යුතුය යන මූලික අයිතීන් උල්ලංඝණය කිරීම පො.ප ඩී.එම්.එස්.පී.එස්. දිසානායක සිදුකර ඇති බවත්, මෙම පහරදීමට සහ අත්අඩංගුවට ගැනීම හා අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා පො.සැ 45687 එච්.පී.කේ සිල්වා සහ පො.කො 80903 ජී.ඩබ්. සේනාරත්න, පො ප බී.ඒ.ජී.එස්.එස්.රාජපක්ෂ විසින් ආධාර අනුබල ලබාදී ඇති බව නිගමනය කරමි.

ඒ අනුව පහත සඳහන් නිර්දේශ සිදු කර සිටී.

1. 02 වන වගඋත්තර පො.ප ඩී.එම්.එස්.පී.එස්. දිසානායක විසින් වින්දිත ආර්.පී.ඩී.පී. ප්‍රනීත් කසුන් මධුසංඛ වෙත රු.25000.00 මුදලක් වන්දි වශයෙන් ගෙවිය යුතුය.
2. 01,02,03 සහ 04 වන වගඋත්තකරුවන් මෙම සිදුවීමේ දී කටයුතු කර ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතුය.

2025. 09 . 24 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් : 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය,බත්තරමුල්ල.

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලිසිය - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.